# බස්නාහිර පළාත් ලේකම්වරුන්ගේ රැස්වීම් වාර්තාව

දිනය : 2019.03.18

වේලාව : ප.ව. 2.00

ස්ථානය : ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත.

**සහභාගී වූ නිලධාරීන්ගේ නාම ලේඛනය :**

| | | | |
|---|---|---|---|
| **1)** | **ප්‍රදීප් යසරත්න මහතා** | **-** | **ප්‍රධාන ලේකම් (බ.ප)** |
| **2)** | **පී. සෝමසිරි මහතා** | **-** | **ආණ්ඩුකාර ලේකම්** |
| **3)** | **එම්.ජී.ඒ.තිලකරත්න මහතා** | **-** | **ලේකම්,රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප)** |
| **4)** | **හේමන්ත සමරකෝන් මහතා** | **-** | **සභා ලේකම්, සභා ලේකම් කාර්යාලය (බ.ප)** |
| **5)** | **චන්ද්‍රානි සමරකෝන් මිය** | **-** | **ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය (බ.ප)** |
| **6)** | **එස්.ජී.විජයබන්ධු මහතා** | **-** | **ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය (බ.ප)** |
| **7)** | **එන්.නිල්වල මහතා** | **-** | **ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය (බ.ප)** |
| **8)** | **කේ. චම්පාඑන්. පෙරේරා මිය** | **-** | **ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය (බ.ප)** |
| **9)** | **එච්.ජී.ජී.ජේ.ධර්මසේන මහතා** | **-** | **ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය (බ.ප)** |
| **10)** | **සිරිසෝම ලොකුවිතාන මහතා** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)** |
| **11)** | **එන්.බන්දුල ප්‍රේමකුමාර මහතා** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)** |
| **12)** | **ඩී.එම්.එන්.දිසානායක මිය** | **-** | **නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්)** |
| **13)** | **පේෂලාආර්. අබේසූරියමිය** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |
| **14)** | **කේ.එන්.සූරියආරච්චි මිය** | **-** | **සහකාර ප්‍රධාන ලේකම් (පාලන)** |
| **15)** | **මහේෂ් විජේසේකර මහතා** | **-** | **ගොඩනැගිලි අධ්‍යක්ෂ** |
| **16)** | **පාලිතඅබේවර්ධන මහතා** | **-** | **ප්‍රධාන නීති නිලධාරි** |

**ප්‍රධාන ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීමේ දී ඉදිරිපත් කරන ලද කරුණු සම්බන්ධව පහත දක්වා ඇති තීරණයන්ටඑළඹෙන ලදී.**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | පළාත් සභා නව ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම සම්බන්ධව | නව පළාත් සභා ගොඩනැගිල්ලේ ස්ථාපිත සියලු ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ තවමත්මිලදීනොගත්අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා ආයතන පිළිබඳව ප්‍රධාන ලේකම් විසින් විමසූ අතර, අදාලමිලදී ගැනීම් ඉතා කඩිනමින් සිදු කළ යුතු බව ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු, නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු |
| 02. | බස්නාහිර පළාත් සභා ගොඩනැගිල්ලේ ආපන ශාලාව ආරම්භ කිරීම | අප්‍රේල් මස 01දිනවන විට ආපන ශාලාව ආරම්භ කළ හැකි බව ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br><br>පළාත් සභාවේ සියලුමනිලධාරීන් වෙත සහනදායී මිලකට ආහාර පානලබාදීම සිදු කරන අතර, ඊට අමතර අනෙකුත් මිල ගණන් තීරණය කිරීම සඳහා කමිටුවේ අනුමැතිය ලබා ගත යුතු බව ප්‍රධාන ලේකම් දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය) |
| 03. | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේදෙපාර්තමේන්තුවේ ලිපි ලේඛන පරිගණකගත කිරීම සම්බන්ධව | ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේදෙපාර්තමේන්තුවේ ලිපි ලේඛන පරිගණකගත කිරීම සම්බන්ධව මෙවර ප්‍රඥප්ති කමිටුවේ සාකච්ඡා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, 2019.03.29 දිනෙන් පසුව මේ සඳහා රැස්වීමක් සූදානම් කරන ලෙසත්,ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශ කරන ලදී. | ප්‍රධාන නීති නිලධාරි<br><br>ලේකම්, ප්‍රවාහන අමාත්‍යාංශය |
| 04. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත වැඩ බැලීම්/රාජකාරි ආවරණය සඳහා අනුමැතිය ලබා ගැනීමට ලැබෙන ඉල්ලීම් සම්බන්ධව | මේ සම්බන්ධව සාකච්ඡාවක් පවත්වා ප්‍රධාන ලේකම් වෙත ප්‍රගතිය වාර්තා කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දන්වන ලදී. | ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 05. | නව ගොඩනැගිල්ල සඳහා වෛද්‍ය මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම | වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා වෙන් කර දී ඇති කාමරයේ නාම පුවරු සවි කර, වායු සමීකරණය කර, අප්‍රේල් 01 දින සිට ආරම්භ කිරීම සඳහා ඉදිරි කටයුතු සිදු කරනලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී.<br><br>එසේම, අදාල කාමරයේ යතුරුභාර දීම සඳහා ඉදිරි කටයුතු සිදු කරන ලෙස තවදුරටත් ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)<br><br>නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු) |
| 06. | ISO විගණනය සම්බන්ධව | ප්‍රධාන ලේකම් කාර්යාලය ඉතා සාර්ථකව ISO 9001-2015 තත්ත්ව සහතිකය ලබා බවත්, බස්නාහිර පළාත් සභාවේ අනෙකුත් අමාත්‍යාංශද මේ සඳහා යොමු විය යුතු බවත්, ප්‍රධාන ලේකම් අවධාරණය කරන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

**<u>නව යෝජනා</u>**

| අංකය | කාරණය | තීරණය | ක්‍රියාත්මක කිරීමේ බලධාරියා |
|---|---|---|---|
| 01. | ත්‍රී රෝද රථයේ රාජකාරි කටයුතු ඉටු කිරීම වෙනුවෙන් දීමනාවක් ගෙවීම මැයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද WPH/A13/01/1/01 හා 2019.02.15 දිනැති ලිපිය | සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ක්ෂේත්‍ර කම්කරු සේවකයින් දෙදෙනා තම නිත්‍ය තනතුරට අයත් රාජකාරිවලට අමතරව සේවා අවශ්‍යතාව මත එම දෙපාර්තමේන්තුවට අයත් ත්‍රී රෝද රථ 2හි ද රාජකාරි කටයුතු සිදු කරන බැවින්, සේවා අවශ්‍යතාව හා සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ අවශ්‍යතාව යන කරුණු පාදක කර ගෙන ඔවුන් හට මාසික දීමනාවක් ගෙවීම සුදුසු බව ප්‍රධාන ලේකම් විසින් ප්‍රකාශකරන ලදී. එසේම, මෙහි දී එම දෙපාර්තමේන්තුවේ රියදුරු පුරප්පාඩු නොපවතින බව, අදාල සේවකයින් හට රියදුරන් ලෙස සේවය කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බව යන කරුණු පිළිබඳව සලකා බැලිය යුතු බව ප්‍රධාන ලේකම් විසින් තවදුරටත් අවධාරණය කරන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 02. | "පළාත් පාලන ආයතන බල ප්‍රදේශයන්හි මහජන සෞඛ්‍ය සේවා විධිමත් කිරීම සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා වෙත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා වූ කමිටුව පළාත තුල සෞඛ්‍ය ආයතන සඳහා භෞතික සම්පත් වැඩිදියුණු කිරීමේ දී මතු වී ඇති ගැටළු" මැයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් යොමු කරන ලද WPH/A12/MC/04 හා 2019.03.18 දිනැති ලිපිය | ගම්පහ මිරිස්වත්ත මාර්ගය සංවර්ධනය කිරීමේ දී ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය සඳහා සුදුසු ඉඩමක් මේ දක්වා සොයා ගැනීමට නොහැකි වී ඇති බව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් දන්වා ඇති බැවින්, ඒපිළිබඳව සොයා බලන ලෙස දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත පවරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අමාත්‍යාංශ ලේකම් වෙත දන්වනලදී.<br><br>අලුතින් ඇති වන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිකාර්යාල සඳහා වන වාහන අවශ්‍යතාව නියමිත ආකෘති පත්‍රය අනුව ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල හරහා ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය |
| 03. | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමේ දී සිදු වන ගැටළු. | අමාත්‍ය මණ්ඩල සංදේශ හරහා ප්‍රතිපාදන ලබා ගැනීමේ දී, ප්‍රතිපාදන සපයා ගන්නා මුලාශ්‍රපිළිබඳව පැහැදිලිව සඳහන් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් උපදෙස් ලබා දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු සහ නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු. |
| 04. | බස්නාහිර පළාත සඳහා උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම | බස්නාහිර පළාතේ උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම සඳහා මේ වන විට ගැසට්නිවේදනය නිකුත් කර ඇති බවත්, විවෘත සහ සීමිත යන කාණ්ඩ 2ටමසහ පාසල්වල සේවය කරනු ලබන සංවර්ධන නිලධාරින් ද අදාලවතරහ විභාග පැවැත්වීමටනියමිත බවත්,රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් ප්‍රධාන ලේකම් දැනුවත් කරන ලදී. | ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 05. | ප්‍රඥප්ති සකස් කිරීම සම්බන්ධව | ප්‍රඥප්ති සකස් කිරීමේදී අදාල අමාත්‍යාංශයේ නීති නිලධාරීයාගේමතයනිර්දේශය සමඟ ඉදිරිපත් කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් දැනුම් දෙන ලදී. | සියලුම අමාත්‍යාංශ ලේකම්වරු |

| | | | |
|---|---|---|---|
| 06. | ව්‍යාජ පත්වීම් ලබා දීම සම්බන්ධව | සංවර්ධන නිලධාරි සහ කළමනාකරණ සහකාරව්‍යාජ පත්වීම් ලබා දීම සම්බන්ධව මුලික විමර්ශනයක් සිදු කර, සතියක් ඇතුළත වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) |
| 07. | බස්නාහිර පළාත් රාජ්‍ය සේවය සඳහා හදිසි විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීම | පළාත් සභාවේ රාජ්‍ය ආයතනවල සිදු වන දූෂණ සහ අක්‍රමිකතා සොයා බැලීම සඳහා හදිසි වැටලීම් ඒකකයක් පිහිටුවීමේ වැදගත්කම ප්‍රධාන ලේකම් විසින් අවධාරණය කරන ලදී. ඒපිළිබඳවසාකච්ඡා කිරීම සඳහා දිනයක් යොදා ගන්නා ලෙස සම්බන්ධීකරණ ලේකම් වෙත දන්වන ලදී. | නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)<br><br>ප්‍රධාන ලේකම් සම්බන්ධීකරණ ලේකම් |

-අත්/කළේ: ප්‍රදීප් යසරත්න,
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

කේ.එන්.සූරියආරච්චි,
සහකාරප්‍රධාන ලේකම් (පාලන),